# 4

# මිල සහ වැටුප්

## 4.1 සමස්ත නිරීක්ෂණ

නිල පාරිභෝගික මිල දර්ශක මගින් මනිනු ලබන පොදු මිල මට්ටම, 2021 වසර තුළ දී සමස්තයක් වශයෙන් ඉහළ යෑමේ ප්‍රවණතාවක් පෙන්නුම් කළ අතර, වසරේ අවසාන කාලපරිච්ඡේදයේ දී කැපී පෙනෙන ඉහළ යෑමක් වාර්තා කළේය. ජාත්‍යන්තර වෙළඳපොළෙහි ආහාර සහ ආහාර නොවන කාණ්ඩවල අයිතමවල මිල ඉහළ යෑම්, භාණ්ඩ ප්‍රවාහන ගාස්තු වැඩිවීම්, අභ්‍යන්තර සැපයුම් ජාල තුළ ඇති වූ අවහිරතා, විවිධ මිල සංශෝධන හරහා ඇති වූ සෘජු සහ වක්‍ර බලපෑම් සහ කොවිඩ්-19 වසංගත තත්ත්වය සාර්ථකව පාලනය කිරීමත් සමඟ ඉල්ලුම ඉහළ යෑම දේශීය අයිතමවල මිල කෙරෙහි සැලකිය යුතු බලපෑමක් ඇති කළේය. 2021 වසරේ දී පොදු මිල මට්ටමේ ඉහළ යෑම සඳහා ආහාර කාණ්ඩය තුළ වන නිතර මිල උච්චාවචනය වන ආහාර කාණ්ඩයට අයත් අයිතමවල මිල විචලනයන් වැඩිම දායකත්වය දක්වන ලදී. තවද, 2021 වසරේ අවසාන කාලපරිච්ඡේදයේ දී නිතර මිල උච්චාවචනය වන ආහාර කාණ්ඩයේ අයිතමවල මිල සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. මේ සඳහා කාබනික ගොවිතැන් ක්‍රම කෙරෙහි නැඹුරුවීමත් සමඟ අස්වැන්න අඩුවීම සහ වසංගත තත්ත්වය මැඩලීම හේතුවෙන් ආර්ථික කටයුතු සාමාන්‍යකරණය වීමත් සමඟ උත්සව සමයේ දී ඉල්ලුම ඉහළ යෑම ප්‍රධාන වශයෙන් හේතු විය. තවද, නිතර මිල උච්චාවචනය වන ආහාර කාණ්ඩයේ අයිතමවල හැර අනෙකුත් ආහාර අයිතමවල මිල 2021 වසර තුළ දී අඛණ්ඩව ඉහළ ගියේය. ආහාර නොවන කාණ්ඩයේ අයිතමවල මිල ගණන් 2021 වසර තුළ දී අඛණ්ඩව ඉහළ ගිය අතර, 2021 වසරේ අවසාන කාලපරිච්ඡේදයේ දී එම ඉහළ යෑමේ වේගය තවදුරටත් ශීඝ්‍ර වූ නමුත් එමගින් පොදු මිල මට්ටම කෙරෙහි ඇති කරන ලද බලපෑම, ආහාර කාණ්ඩය මගින් ඇති කළ බලපෑමට වඩා අඩු මට්ටමක පැවතුණි. මෙම ප්‍රවණතා පිළිබිඹු කරමින්, 2021 ජනවාරි මාසයේ දර්ශකාංක 138.7ක් වාර්තා කළ කොළඹ පාරිභෝගික මිල දර්ශකය (කො.පා.මි.ද., 2013=100) 2021 දෙසැම්බර් මාසයේ දී දර්ශකාංක 154.7 දක්වා සමස්තයක් ලෙස ඉහළ යෑමේ ප්‍රවණතාවක් පෙන්නුම් කළ අතර, ජාතික පාරිභෝගික මිල දර්ශකය (ජා.පා.මි.ද., 2013=100) 2021 ජනවාරි මාසයේ දී වාර්තා කළ දර්ශකාංක 142.1හි සිට 2021 දෙසැම්බර් මාසයේ දී දර්ශකාංක 161.0 දක්වා ඉහළ ගියේය. වැටුප් සම්බන්ධයෙන් ගත් කළ, විධිමත් සහ අවිධිමත් පෞද්ගලික අංශවල නාමික හා මූර්ත වැටුප්, 2020 වසරට සාපේක්ෂව 2021 වසරේ දී ඉහළ යෑමක් පෙන්නුම් කරන ලදී. විධිමත් පෞද්ගලික අංශයේ වැටුප් ඉහළ යෑම සඳහා අවම වැටුප්වලට අදාළව සිදු කළ සංශෝධන හේතු වූ අතර, අවිධිමත් පෞද්ගලික අංශයේ වැටුප් ඉහළ යෑම සඳහා කොවිඩ්-19 වසංගතය හේතුවෙන් පැනවූ සංචරණ සීමා ලිහිල් කිරීමත් සමඟ ආර්ථික කටයුතු සාමාන්‍ය තත්ත්වයට පත්වී ශ්‍රම ඉල්ලුම ඉහළ යෑම සහ ජීවන වියදම ඉහළ යෑම හේතු විය. රාජ්‍ය අංශය සම්බන්ධයෙන් සැලකූ විට නාමික වැටුප් ප්‍රමාණ දර්ශකය 2020 සහ 2021 වසර දෙක තුළ දී නොවෙනස්ව පැවති අතර, 2020 වසරට සාපේක්ෂව 2021 වසරේ දී මූර්ත වැටුප් ප්‍රමාණ දර්ශකයේ අඩු වීමක් දක්නට ලැබුණි.

## 4.2 මිල

### පොදු මිල මට්ටමේ විචලන

**නිල පාරිභෝගික මිල දර්ශක වන කො.පා.මි.ද. සහ ජා.පා.මි.ද.[1] මගින් මනිනු ලබන පොදු මිල මට්ටම, වැඩි වශයෙන් ආහාර කාණ්ඩයේ අයිතමවල මිල ගණන් හා අනුරූපව විචලනය වෙමින්, 2021 වසර පුරා සමස්තයක් ලෙස ඉහළ යෑමේ ප්‍රවණතාවක් පෙන්නුම් කළේය.** ආහාර කාණ්ඩයේ අයිතමවල මිල ගණන් වසර තුළ සමස්තයක් ලෙස ඉහළ යෑමේ ප්‍රවණතාවක් පෙන්නුම් කළේය. ආහාර නොවන කාණ්ඩයේ අයිතමවල මිල ද මෙම වසරේ දී සමස්ත වශයෙන් ඉහළ යෑමේ ප්‍රවණතාවක් පෙන්නුම් කළ නමුත්, එම කාණ්ඩය මගින් පොදු මිල මට්ටමට ඇති කළ බලපෑම ආහාර කාණ්ඩයට සාපේක්ෂව අඩු මට්ටමක පැවතුණි. 2021 වසරේ මහ කන්නයේ ලැබුණු යහපත් අස්වැන්න නිසා ආහාර කාණ්ඩයේ මිල ගණන් පහළ යෑම හේතුවෙන් 2021 වසරේ මාර්තු මාසයේ දී පොදු මිල මට්ටමේ අඩුවීමක් දක්නට ලැබුණු අතර, අනෙකුත් සියලුම මාසවල දී පොදු මිල මට්ටම අඛණ්ඩ ඉහළ යෑමක් පෙන්නුම් කළේය. තවද, ජාත්‍යන්තර වෙළඳපොළෙහි භාණ්ඩවල මිල වැඩිවීම්, භාණ්ඩ ප්‍රවාහන ගාස්තු ඉහළ යෑම්, නිෂ්පාදන හිඟතාවයන් සහ සැපයුම් ජාලවල පැවති අවහිරතා පොදු මිල මට්ටම කෙරෙහි සැලකිය යුතු බලපෑමක් ඇති කළේය. මීට අමතරව ආහාර සහ ආහාර නොවන කාණ්ඩ දෙකෙහිම විවිධ අයිතමවල සිදු වූ මිල වැඩිවීම් හේතුවෙන් ඇති වූ වක්‍ර බලපෑම් ද පොදු මිල මට්ටම මත සැලකිය යුතු බලපෑමක් ඇති කරන ලද අතර, මේ හේතූන් නිසා, 2021 වසරේ අවසාන කාලයේ දී පොදු මිල මට්ටම සැලකිය යුතු මට්ටමකින් ඉහළ ගියේය. සීමිත සැපයුමක් පැවති භාණ්ඩ හා සේවාවන්හි මිල ඉහළ යෑම කෙරෙහි බැංකු පද්ධතිය මගින් ලබා දුන් ණය හේතු කොටගෙන ජනතාවගේ මුදල් ආදායම් ඉහළ යෑමද හේතු විය. තවද, කොවිඩ්-19 වසංගත තත්ත්වය හේතුවෙන් අඩු වී තිබූ පාරිභෝගික ඉල්ලුම 2021 වසර අවසානය වන විට යථා තත්ත්වයට පත්වීම ද මිල මට්ටම කෙරෙහි බලපෑමක් ඇති කළේය.

**4.1 සංඛ්‍යා සටහන**
**තෝරාගත් ආහාර අයිතම මත පනවන ලද උපරිම සිල්ලර මිල - 2021**

| අයිතමය | උපරිම සිල්ලර මිල (කිලෝග්‍රෑමයට රු.) | උපරිම සිල්ලර මිල බලපැවැත් වූ දිනය |
|---|---|---|
| සහල් | | 2021.09.02 (අ) |
| සම්බා | 103.00 | |
| නාඩු | 98.00 | |
| සුදු කැකුළු | 95.00 | |
| රතු කැකුළු | 95.00 | |
| සුදු සීනි | | 2021.09.02 (ආ) |
| පැකට් නොකළ | 122.00 | |
| පැකට් කළ | 125.00 | |

(අ) 2021 සැප්තැම්බර් 29 වන දින සිට බලපැවැත්වෙන පරිදි උපරිම සිල්ලර මිල ඉවත් කෙරිණි.
(ආ) 2021 නොවැම්බර් 03 වන දින සිට බලපැවැත්වෙන පරිදි උපරිම සිල්ලර මිල ඉවත් කෙරිණි.


මූලයː පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය

**2021 වසර පුරා ඉහළ ගිය නිතර මිල උච්චාවචන[2] සහිත ආහාර කාණ්ඩයේ මිල ගණන් වසරේ අවසාන මාස දෙක තුළ දී සැලකිය යුතු ලෙස ඉහළ යෑම් පෙන්නුම් කරන ලදී.** තවද, පූර්ණ වශයෙන් කාබනික ගොවිතැන වෙත නැඹුරු වීමට දැරූ උත්සාහයන් සමඟ පැන නැඟුණු ගැටලු, එනම්, ප්‍රමාණවත් කාබනික පොහොර නොමැති වීම, කාබනික ගොවිතැන සඳහා නිසි මගපෙන්වීම් සහ උපදෙස් නොලැබීම, රට තුළ ඉතිරිව පැවති රසායනික පොහොරවල මිල අධික ලෙස ඉහළ යෑම, වගා හානි වැඩිවීම සහ අස්වැන්න අඩුවීම, නිතර මිල උච්චාවචන සහිත ආහාර අයිතමවල මිල ගණන් ඉහළ යෑම කෙරෙහි සැලකිය යුතු පීඩනයක් ඇති කරන ලදී. ප්‍රධාන වශයෙන් සහල්, පොල්, අමු මිරිස් සහ එළවළු මිල ඉහළ යෑම හේතුවෙන් නිතර මිල උච්චාවචන සහිත ආහාර කාණ්ඩයේ මිල ගණන් 2021 ජනවාරි සහ 2021 පෙබරවාරි මාසවල දී ඉහළ ගියේය. එසේ වුවද, පොල්, එළවළු, ළූණු, අමු මිරිස් සහ අර්තාපල් මිල අඩුවීම හේතුවෙන් නිතර මිල උච්චාවචන සහිත ආහාර කාණ්ඩයේ අයිතමවල මිල ගණන් 2021 මාර්තු සහ අප්‍රේල් මාසවල දී පහළ ගියේය. ඉන් අනතුරුව, මෙම පහළ යෑමේ ප්‍රවණතාව වෙනස් වී, 2021 ජූනි මාසයේ දී එම කාණ්ඩයේ මිල ගණන් කැපී පෙනෙන ලෙස ඉහළ ගිය අතර, ඒ සඳහා සහල්, එළවළු සහ නැවුම් මත්ස්‍ය මිල ගණන් ඉහළ යෑම හේතු විය. මෙම ඉහළ යෑමේ ප්‍රවණතාව 2021 ජූලි මාසයේ දී ද දක්නට ලැබුණි. සහල්, පොල් සහ ළූණු මිල පහළ යෑම හේතුවෙන් 2021 අගෝස්තු මාසයේ දී නිතර මිල උච්චාවචන සහිත ආහාර කාණ්ඩයේ මිල ප්‍රවණතාව වෙනස් වූ අතර, සහල් සහ එළවළු මිල පහළ යෑම 2021 සැප්තැම්බර් මාසයේ දී එම කාණ්ඩයේ මිල ගණන් පහළ යෑමට මූලික විය.

1 ජනලේඛන සහ සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් නිල පාරිභෝගික මිල දර්ශක වන ජාතික පාරිභෝගික මිල දර්ශකය (ජා.පා.මි.ද., 2013=100) සහ කොළඹ පාරිභෝගික මිල දර්ශකය (කො.පා.මි.ද., 2013=100) මාසිකව සම්පාදනය කරනු ලබයි. ජා.පා.මි.ද. මගින් ජාතික මට්ටම නියෝජනය වන ලෙස තෝරාගත් පාරිභෝගික අයිතමවල මිල වෙනස් වීම් පෙන්නුම් කරනු ලබන අතර කො.පා.මි.ද. මගින් කොළඹ දිස්ත්‍රික්කයේ නාගරික ජනතාව නියෝජනය වන ලෙස තෝරාගත් පාරිභෝගික අයිතමවල මිල වෙනස්වීම් පෙන්නුම් කරනු ලබයි.

2 සහල්, මස් වර්ග, නැවුම් මත්ස්‍ය සහ මුහුදු ආහාර, පොල්, පලතුරු, එළවළු, අර්තාපල්, ළූණු සහ තෝරාගත් කුළුබඩු වර්ග නිතර මිල උච්චාවචන සහිත ආහාර කාණ්ඩයට ඇතුළත් වේ.

### 4.1 රූප සටහන
### මිල සහ වැටුප් විචලන - 2021




(අ) නිතර මිල උච්චාවචනය වන ආහාර කාණ්ඩයට සහල්, මස් වර්ග, නැවුම් මත්ස්‍ය සහ මුහුදු ආහාර, පොල්, පලතුරු, එළවළු, අර්තාපල්, ළූණු සහ තෝරාගත් කුළුබඩු වර්ග ඇතුළත් වේ.

(ආ) අනෙකුත් ආහාර කාණ්ඩයට නිතර මිල උච්චාවචනය වන ආහාර අයිතම හැර අනෙකුත් ආහාර ඇතුළත් වේ.


(ඇ) නාමික සහ මූර්ත වැටුප් වෙනස ලෙස 2021 සහ 2020 වසරවල සාමාන්‍ය අතර ප්‍රතිශතමය වෙනස දක්වා ඇත.

(ඈ) පඩිපාලක සභා මගින් වැටුප් පාලනය වන විධිමත් පෞද්ගලික අංශයේ සේවකයන්ගේ වැටුප් වේ.

ඉන් අනතුරුව, 2021 ඔක්තෝබර් මාසයේ දී මෙම කාණ්ඩයේ මිල ගණන් ඉහළ ගිය අතර ඒ සඳහා, සහල්, පලතුරු, ලොකු ළූණු සහ කුකුළු මස් මිල ඉහළ යෑම හේතු විය. තවද, 2021 නොවැම්බර් සහ දෙසැම්බර් මාසවල දී නිතර මිල උච්චාවචන සහිත ආහාර කාණ්ඩයේ මිල ගණන් කැපී පෙනෙන වැඩිවීමක් පෙන්නුම් කළ අතර, මේ සඳහා සහල්, එළවළු, අමු මිරිස්, කුකුළු මස්, නැවුම් මත්ස්‍ය, පොල්, අර්තාපල් සහ ළූණු මිල ගණන් ඉහළ යෑම සහ උත්සව සමයේ ඇති වූ ඉහළ පාරිභෝගික ඉල්ලුම හේතු විය. 2020/2021 මහ කන්නයේ අස්වැන්න වෙළඳපොළට ලැබෙන මාස ද ඇතුලුව, 2021 ජූලි මාසය දක්වා කාලපරිච්ඡේදය තුළ දී සහල් මිල අඛණ්ඩව ඉහළ ගියේය. කෙසේ වුවද, රජය මගින් ගනු ලැබූ පියවර කිහිපයක් හේතුවෙන් 2021 වසරේ අගෝස්තු සහ සැප්තැම්බර් මාසවල දී සහල් මිල පහළ ගියේය. තවද, වසරකට වැඩි කාලයක්


4

**4.2 රූප සටහන**
**සතිපතා සිල්ලර මිල - සහල්**




මූලයː ශ්‍රී ලංකා මහ බැංකුව


**4.3 රූප සටහන**
**සතිපතා සිල්ලර මිල - එළවළු**




(අ) බෝංචි, කැරට්, ගෝවා, බීට්රූට්, ලීක්ස්, තක්කාලි සහ රාබුවල සතිපතා මිල ගණන්හි සාමාන්‍ය වේ.
(ආ) වම්බටු, වට්ටක්කා, මෑකරල්, බණ්ඩක්කා, කරවිල සහ පතෝලවල සතිපතා මිල ගණන්හි සාමාන්‍ය වේ.


මූලයː ශ්‍රී ලංකා මහ බැංකුව

**4.4 රූප සටහන**
**සතිපතා සිල්ලර මිල - පොල් (මධ්‍යම)**




මූලයː ශ්‍රී ලංකා මහ බැංකුව

**4.5 රූප සටහන**
**සතිපතා සිල්ලර මිල - මාළු (අ)**





(අ) කෙලවල්ලා, තලපත්, පරා, බලයා, ගල් මාළු, තෝරා, මෝරා, සාලයා, හුරුල්ලා, හාල්මැස්සා, කුම්බලාවා සහ ලින්නා සතිපතා මිල ගණන්හි සාමාන්‍ය වේ.

මූලයː ශ්‍රී ලංකා මහ බැංකුව

පුරා නොවෙනස්ව පැවති සම්බා, නාඩු, සුදු කැකුළු සහ රතු කැකුළු සහල් මිල මත පනවා තිබූ උපරිම සිල්ලර මිල ගණන් 2021 සැප්තැම්බර් මාසයේ දී ඉහළ නැංවුවද, වෙළඳපොළෙහි සහල් හිඟයක් ඇතිවීම වැළැක්වීමේ අරමුණින් එම මාසයේදීම උපරිම සිල්ලර මිල ගණන් පනවමින් නිකුත් කළ ගැසට් නිවේදනය අවලංගු කරන ලදී. මේ අතර, සහල් සැපයුමේ ඇති වූ ගැටලුකාරී තත්ත්වයන් මඟහැරවීම සඳහා ආනයනික සහල් මත පනවා තිබූ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද 2021 නොවැම්බර් මාසය ආරම්භයේ දී පහළ දමන ලදී. තවද, 2021 සැප්තැම්බර් මාසයේ දී උපරිම සිල්ලර මිල ගණන් ඉවත් කිරීමත් සමඟ සියලුම දේශීය සහල් වර්ගවල මිල ගණන් ඉතා වේගයෙන් ඉහළ යනු දක්නට ලැබුණි. මේ සඳහා, විශේෂයෙන්ම කොවිඩ්-19 ව්‍යාප්තිය සාර්ථකව පාලනය කිරීමත් සමඟ 2021 නොවැම්බර් සහ දෙසැම්බර් මාසවල දී ආර්ථික කටයුතු සාමාන්‍යකරණය වී උත්සව සමයේ දී ඉහළ ඉල්ලුමක් ඇතිවීම හේතු විය.


කොවිඩ්-19 වසංගතයේ ව්‍යාප්තියත් සමඟ පනවන ලද සංචරණ සීමා, ප්‍රධාන ආර්ථික මධ්‍යස්ථානවල වෙළඳාම් කටයුතු සීමාසහිත වීම සහ අහිතකර කාලගුණික තත්ත්වයන් හේතුවෙන් එළවළු සැපයුමට ඇති වූ බාධා මූලික කොටගෙන, 2021 වසර තුළ දී එළවළු මිල ගණන් මිශ්‍ර විචලන පෙන්නුම් කළේය. මේ අතර, වසරේ අවසන් මාස දෙක තුළ දී එළවළු මිල ගණන් ඉහළ යෑමට පොහොර සහ කෘමිනාශක හිඟය නිසා නිෂ්පාදනය අවම වීම සහ උත්සව සමයේ ඇති වූ ඉහළ ඉල්ලුම ප්‍රධාන වශයෙන් හේතු විය. පොල් මිල ගණන් සමස්තයක් ලෙස 2021 වසර තුළ දී පහළ ගිය අතර, මේ හේතුවෙන් පොල් සඳහා උපරිම සිල්ලර මිල ගණන් පනවමින් නිකුත් කළ ගැසට් නිවේදනය 2021 ජූනි 18 වන දින සිට බලපැවැත්වෙන පරිදි අවලංගු කරන ලදී. කෙසේ වුවද, සෘතුමය සාධක, උත්සව කාලය තුළ ඇති වූ ඉහළ පරිභෝජනය සහ ජාත්‍යන්තර වෙළඳපොළෙහි දිසිඳි පොල් (desiccated coconut) සඳහා ඉල්ලුම ඉහළ

**4.6 රූප සටහන**
**සතිපතා සිල්ලර මිල - අර්තාපල්**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

**4.7 රූප සටහන**
**සතිපතා සිල්ලර මිල - ආනයනික ලොකු ළූණු**





මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

යැමෙන් දේශීය පරිභෝජනයට අවශ්‍ය පොල් හිඟ වීම හේතුවෙන් 2021 ඔක්තෝබර් සහ දෙසැම්බර් දක්වා කාලපරිච්ඡේදයේ දී පොල් මිල ගණන් ඉහළ යෑමේ ප්‍රවණතාවක් පෙන්නුම් කළේය. කුකුළු ආහාර සඳහා යොදාගනු ලබන බඩ ඉරිඟු සහ ප්‍රතිජීවක ඖෂධ ආදියෙහි මිල ගණන් ඉහළ යෑම හේතුවෙන් කුකුළු මස් නිෂ්පාදන පිරිවැය ඉහළ ගිය අතර, මේ හේතුවෙන් 2021 වසර තුළ දී කුකුළු මස් මිල සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. මේ අතර, ලොකු සහ කුඩා මාළු වර්ග දෙකෙහිම මිල ගණන් 2021 වසර තුළ දී ඉහළ ගියේය. තවද, විශේෂ වෙළඳ භාණ්ඩ බදු සංශෝධන කිහිපයකට ලක් වූ අර්තාපල් මිල, 2021 වසරේ මුල් මාස නවය තුළ දී බොහෝ දුරට ස්ථාවර මට්ටමක පැවතුණද, ඉන් අනතුරුව සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. 2021 වසර තුළ දී රතු ළූණු මිල සමස්තයක් ලෙස පහළ ගිය අතර, රජය මගින් සිදු කළ කාලෝචිත මැදිහත්වීම් හේතුවෙන් වසර තුළ බොහෝදුරට ස්ථාවරව පැවති ලොකු ළූණු මිල, වසර අග භාගයේ දී අඛණ්ඩ ඉහළ යෑමේ ප්‍රවණතාවක් පෙන්නුම් කළේය. මේ අතර, වෙළඳපොළ තුළ අත්‍යවශ්‍ය ආහාර හිඟයක් ඇති වීම වැළැක්වීමේ අරමුණින්, නිතර මිල උච්චාවචනය වන ආහාර කාණ්ඩය තුළ ඇති ආනයනික අර්තාපල් සහ ලොකු ළූණු මත පාලන මිල පනවමින් නිකුත් කර තිබූ ගැසට් නිවේදන 2021 නොවැම්බර් 03 වන දින සිට බලපැවැත්වෙන පරිදි අවලංගු කරන ලදී.

**2021 වසර තුළ නිතර මිල උච්චාවචන සහිත ආහාර අයිතම හැර අනෙකුත් ආහාර අයිතමවල මිල ගණන් අඛණ්ඩව ඉහළ ගියේය.** ඒ අනුව, 2021 වසර තුළ නොකඩවා ඉහළ ගිය පරිප්පු මිල, 2020 වසරේ දී නිරීක්ෂණය වූ මිල මට්ටම්වලට වඩා ඉහළ අගයක පැවති අතර, මේ සඳහා ජාත්‍යන්තර වෙළඳපොළ මිල ගණන් සහ භාණ්ඩ ප්‍රවාහන ගාස්තු ඉහළ යෑම් හේතු විය. උත්සව සමය තුළ වැඩි වූ ඉල්ලුම හේතුවෙන් 2021 අප්‍රේල් මාසය තුළ දී ඉහළ ගිය සීනි මිල, 2021 අගෝස්තු මාසයේ දී ඉහළම සීනි මිල වාර්තා කළ අතර, සීනි ආනයනය සඳහා ආනයනික බලපත්‍රයක් ලබා ගැනීම අනිවාර්ය කිරීමේ තීරණය ඊට හේතු විය.


4

**4.8 රූප සටහන**
**සතිපතා සිල්ලර මිල - සීනි**





මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

**4.9 රූප සටහන**
**ජාත්‍යන්තර වෙළඳපොළ මිල - සීනි**





මූලය: ලෝක බැංකුව

**4.10 රූප සටහන**
**සතිපතා සිල්ලර මිල - පරිප්පු**




**4.11 රූප සටහන**
**සතිපතා සිල්ලර මිල - තිරිඟු පිටි**





රජය මගින් රට තුළ ප්‍රමාණවත් සීනි තොග පවතින බවට දැනුම්වත් වී මෙම තීරණය ගනු ලැබුව ද, පෞද්ගලික වෙළඳුන් විසින් දේශීය වෙළඳපොළට සීනි තොග සැපයීම සීමා කිරීම හේතුවෙන් සීනි මිල මත ඉහළ පීඩනයක් ඇති විය. තවද, ජාත්‍යන්තර වෙළඳපොළේ සීනි නිෂ්පාදනය පහත වැටීම සහ ඉල්ලුම ඉහළ යෑම හේතුවෙන් ජාත්‍යන්තර වෙළඳපොළේ සීනි මිල 2020 වසරට සාපේක්ෂව 2021 වසරේ දී ඉහළ මට්ටමහි පැවතුණි. මේ හේතුවෙන්, ඉහළ ගිය සීනි මිල පහළ දැමීම සඳහා, 2021 සැප්තැම්බර් 02 වන දින සිට බලපැවැත්වෙන පරිදි සුදු සීනි මත උපරිම සිල්ලර මිල ගණන් පනවන ලදී. කෙසේ වුවද, 2021 සැප්තැම්බර් මාසයේ මැද සිට සීනි මිල ඉහළ යන ප්‍රවණතාවක් පෙන්නුම් කිරීම හේතුවෙන් සීනි මත පනවා තිබූ උපරිම සිල්ලර මිල ගණන් 2021 නොවැම්බර් 03 වන දින සිට බලපැවැත්වෙන පරිදි ඉවත් කරන ලදී. ඕස්ට්‍රේලියාවේ සහ නවසීලන්තයේ පැවති අයහපත් කාලගුණික තත්ත්වයන් හේතුවෙන් නිෂ්පාදනය සීමිත වීම, කොවිඩ්-19 ආශ්‍රිත සීමාවන් ක්‍රමයෙන් ලිහිල් කිරීමත් සමඟ ආර්ථික කටයුතු සාමාන්‍යකරණය වීම තුළ ගෝලීය ඉල්ලුම ඉහළ යෑම වැනි හේතු නිසා ජාත්‍යන්තර වෙළඳපොළේ කිරිපිටි මිල ඉහළ ගියේය. ඒ අනුව, 2020 වසර පුරා නොවෙනස්ව පැවති ආනයනික කිරිපිටි මිල, ජාත්‍යන්තර වෙළඳපොළේ මිල ඉහළ යෑම, භාණ්ඩ ප්‍රවාහන ගාස්තු ඉහළ යෑම සහ පාලන මිල ඉවත් කිරීම යන හේතු නිසා 2021 ඔක්තෝබර් මාසයේ දී ඉහළ සංශෝධනයකට ලක් වූයේය. ඉන් අනතුරුව 2021 ඔක්තෝබර් 15 වන දින සිට දේශීය කිරිපිටි මිල ඉහළ දමන ලදී. ඉන් පසුව, 2021 අවසානය වන විට ආනයනික කිරිපිටි මිල නැවතත් ඉහළ ගියේය. මේ අතර, දේශීය කරවල නිෂ්පාදකයන් දිරිමත් කිරීමේ අරමුණින්, 2021 අගෝස්තු 12 වන දින සිට බලපැවැත්වෙන පරිදි කරවල කිලෝග්‍රෑමයක් මත වූ රුපියල් 100ක විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද එලෙසම පවත්වාගෙන යායුතු බවට ගැසට් නිවේදනයක් නිකුත් කරන ලදී. තවද, 2021 ඔක්තෝබර් 10 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි තිරිඟු පිටි කිලෝග්‍රෑමයක මිල රුපියල් 10කින් ඉහළ දැමීම හේතුවෙන්, 2021 ඔක්තෝබර් 11 වන දින සිට ග්‍රෑම් 450ක් බරැති පාන් ගෙඩියක මිල රුපියල් 5කින් ඉහළ දැමූ අතර, ඊට සමගාමීව බනිස් සහ කේක් වැනි අනෙකුත් බේකරි නිෂ්පාදනවල මිල ගණන් ද ඉහළ දමන ලදී. ඉන් අනතුරුව, තිරිඟු පිටි මිල නැවතත් ඉහළ දැමූ අතර, එහි ප්‍රතිඵලයක් ලෙස 2021 නොවැම්බර් 29

**4.2 සංඛ්‍යා සටහන**
**තෝරාගත් ආහාර අයිතම මත පනවන ලද විශේෂ වෙළඳ භාණ්ඩ බදු - 2021**

| අයිතමය | විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද (කිලෝග්‍රෑමයට රු.) | විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද බලපැවැත් වූ දිනය |
|---|---|---|
| ආනයනික සහල් | | |
| සම්බා | 65.00 | 2021.10.11 |
| | 0.25 | 2021.11.02 |
| නාඩු | 65.00 | 2021.10.11 |
| | 0.25 | 2021.11.02 |
| සුදු කැකුළු | 65.00 | 2021.10.11 |
| | 0.25 | 2021.11.02 |
| රතු කැකුළු | 65.00 | 2021.10.11 |
| | 0.25 | 2021.11.02 |
| ආනයනික අර්තාපල් | 15.00 | 2021.02.12 |
| | 50.00 | 2021.04.27 |
| | 20.00 | 2022.01.01 |
| ආනයනික ලොකු ළූණු | 0.25 | 2021.01.14 |
| | 40.00 | 2021.09.08 |
| | 10.00 | 2022.01.01 |
| පරිප්පු | | |
| පියලි නොකළ | 0.25 | 2021.01.14 |
| පියලි කළ | 0.25 | 2021.01.14 |
| රතු ළූණු | 50.00 | 2021.05.18 |
| හාල්මැස්සන් | 100.00 | 2021.02.12 |
| කරවල | 100.00 | 2021.02.12 |


මූලය: මුදල් අමාත්‍යාංශය

**4.12 රූප සටහන**
**ජාත්‍යන්තර වෙළඳපොළ මිල - බොරතෙල්**




මූලයන්: ලං.ඛ.නී.ස සහ අනෙකුත් අපනයන ආයතන
ලංකා අයි.ඕ.සී.

**4.13 රූප සටහන**
**ජාත්‍යන්තර වෙළඳපොළ මිල - එල්.පී. ගෑස්**




මූලය: සෞදි ඇරැම්කෝ එල්.පී. ගෑස් මිල

වන දින සිට ග්‍රෑම් 450ක් බරැති පාන් ගෙඩියක මිල රුපියල් 10කින් ඉහළ ගියේය. ඉන් අනතුරුව, පාන් ඇතුළු සියලුම බේකරි නිෂ්පාදනවල යෙදවුම් පිරිවැය සහ අනෙකුත් වෙළඳපොළ තත්ත්වයන් අනුව ඒවායේ මිල තීරණය කිරීමට ඉඩ සැලසීමේ අරමුණින් 2021 දෙසැම්බර් 21 වන දින සිට එම අයිතමයන් මත පනවා තිබූ මිල පාලනයන් ඉවත් කළ බව නිවේදනය

**4.3 සංඛ්‍යා සටහන**
**තෝරාගත් වෙළඳ භාණ්ඩ සඳහා සිදු කළ පරිපාලිත මිල සංශෝධන - 2021**

| අයිතමය | ඒකකය | සංශෝධිත මිල (රු.) | බලපැවැත් වූ දිනය |
|---|---|---|---|
| කිරි පිටි | | | |
| ආනයනික | ග්‍රෑම් 400 | 480.00 | 2021.10.09 |
| | ග්‍රෑම් 400 | 540.00 | 2021.12.31 |
| දේශීය | ග්‍රෑම් 400 | 470.00 | 2021.10.15 |
| තිරිඟු පිටි | | | |
| ප්‍රීමා සමාගම | කි.ග්‍රෑ. 1 | 97.00 | 2021.10.10 |
| | කි.ග්‍රෑ. 1 | 114.50 | 2021.11.27 |
| සෙරන්ඩිබ් සමාගම | කි.ග්‍රෑ. 1 | 97.00 | 2021.10.10 |
| | කි.ග්‍රෑ. 1 | 114.50 | 2021.11.29 |
| එල්.පී. ගෑස් | | | |
| ලිට්‍රෝ ගෑස් ලංකා සමාගම | කි.ග්‍රෑ. 9.6 | 1,150.00 | 2021.07.25 |
| | කි.ග්‍රෑ. 12.5 | 2,675.00 | 2021.10.10 |
| ලාෆ්ස් ගෑස් සමාගම | කි.ග්‍රෑ. 12.5 | 1,856.00 | 2021.08.12 |
| | කි.ග්‍රෑ. 12.5 | 2,840.00 | 2021.10.10 |
| ඉන්ධන | | | |
| පෙට්‍රල් (92 ඔක්ටේන්) | | | |
| ලං.ඛ.නී.ස. සහ ලංකා අයි.ඕ.සී. | ලීටර් 1 | 157.00 | 2021.06.12 |
| ලංකා අයි.ඕ.සී. | ලීටර් 1 | 162.00 | 2021.10.22 |
| ලං.ඛ.නී.ස. සහ ලංකා අයි.ඕ.සී | ලීටර් 1 | 177.00 | 2021.12.21 |
| සුදු ඩීසල් | | | |
| ලං.ඛ.නී.ස. සහ ලංකා අයි.ඕ.සී. | ලීටර් 1 | 111.00 | 2021.06.12 |
| ලංකා අයි.ඕ.සී. | ලීටර් 1 | 116.00 | 2021.10.22 |
| ලං.ඛ.නී.ස. සහ ලංකා අයි.ඕ.සී. | ලීටර් 1 | 121.00 | 2021.12.21 |
| භූමිතෙල් | | | |
| ලං.ඛ.නී.ස. | ලීටර් 1 | 77.00 | 2021.06.12 |
| ලං.ඛ.නී.ස. | ලීටර් 1 | 87.00 | 2021.12.21 |

මූලයන්: පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය
ශ්‍රී ලංකා මහ බැංකුව

කරන ලදී. විශේෂයෙන්ම 2021 නොවැම්බර් 03 වන දින සිට සුදු සීනි, පරිප්පු, කුකුළු මස්, ටින් මාළු, තිරිඟු පිටි, මුං ඇට, කඩල, කරවල, බඩ ඉරිඟු සහ ආනයනික කිරිපිටි යන අත්‍යවශ්‍ය භාණ්ඩ කිහිපයක මිල පාලනය සඳහා පනවා තිබූ ගැසට් නිවේදන අවලංගු කරන ලදී.

**ආහාර නොවන කාණ්ඩයේ අයිතමවල මිල ගණන් මගින් පොදු මිල මට්ටම මත ඇති කරන ලද බලපෑම ආහාර කාණ්ඩයට සාපේක්ෂව අවම වුවද, 2021 වසර පුරා අඛණ්ඩව ඉහළ යමින් වසර අවසානයේ වැඩි වේගයකින් ඉහළ ගියේය.** 2021 වසරේ දී ජාත්‍යන්තර වෙළඳපොළේ බොරතෙල් මිල ඉහළ ගිය අතර, මේ සඳහා කොවිඩ්-19 එන්නත්කරණයේ සැලකිය යුතු ප්‍රගතිය, වසංගත ආශ්‍රිත සීමාවන් ලිහිල් කිරීම සහ ආර්ථික ක්‍රියාකාරකම් සාමාන්‍යකරණය වීම හේතුවෙන් බොරතෙල් සැපයුමට වඩා ඉල්ලුමේ ඉහළ යෑම හේතු විය. මෙම ජාත්‍යන්තර වෙළඳපොළේ බොරතෙල් මිල ඉහළ යෑම ආනයනික බොරතෙල්[3] මිල ගණන්හි පෙන්නුම් කළ අතර, ඒ අනුව 2020 දෙසැම්බර් මාසයට සාපේක්ෂව 2021 දෙසැම්බර් මාසයේ දී ආනයනික බොරතෙල් මිල[3] සියයට 64.6කින් ඉහළ ගියේය. එහි ප්‍රතිඵලයක් වශයෙන්, 2021 වසරේ දී පෙට්‍රල් (ඔක්ටේන් 92), සුදු ඩීසල් සහ භූමිතෙල්වල දේශීය මිල ගණන් දෙවරක් වැඩි කරන ලද අතර එය පොදු මිල මට්ටම මත අමතර වක්‍ර පීඩනයක් ඇති කරන ලදී. මීට අමතරව, වාහන අමතර කොටස් මිල, වාහන සේවා පිරිවැය සහ කුලී රථ ගාස්තු වසර තුළ ඉහළ ගියේය. තවද, 2021 වසරේ අවස්ථා කිහිපයක දී ආපනශාලා සහ හෝටල් උප කාණ්ඩයට අයත් පිළියෙළ කරන ලද ආහාර අයිතම කිහිපයක මිල ගණන්වල ඉහළ යෑම් වාර්තා වූ

3 ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව (ලං.ඛ.නී.ස.) සහ අනෙකුත් අපනයන ආයතන, ලංකා අයි.ඕ.සී. පොදු සීමිත සමාගම

අතර, ඒ සඳහා අර්ධ වශයෙන් හේතු වූයේ ජාත්‍යන්තර වෙළඳපොළේ එල්.පී. ගෑස් මිල ඉහළ යැමත් සමඟ 2021 ඔක්තෝබර් 10 වන දින සිට ලිට්‍රෝ ගෑස් ලංකා සමාගම සහ ලාෆ්ස් ගෑස් සමාගම විසින් කිලෝග්‍රෑම් 12.5ක් බරැති එල්.පී. ගෑස් සිලින්ඩරයක මිල සැලකිය යුතු ලෙස ඉහළ දැමීමයි. එමෙන්ම, 2020 දෙසැම්බර් මාසයට අනුරූපව 2021 දෙසැම්බර් මාසයේ දී ගෝලීය එල්.පී. ගෑස්[4] වෙළඳපොළ තුළ ප්‍රොපේන් සහ බියුටේන් මිල පිළිවෙළින් සියයට 76.6 සහ සියයට 63.0කින් සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. දේශීය වෙළඳපොළේ එල්.පී. ගෑස් මිල සංශෝධනවලට අමතරව, ආහාර මිල ගණන් ඉහළ යැමද පිළියෙල කරන ලද ආහාර මිල ගණන් ඉහළ යැමට ප්‍රධාන වශයෙන් හේතු විය. ජාත්‍යන්තර පාසල් ගාස්තු සහ ද්විතීයික අධ්‍යාපනය සඳහා වන උපකාරක පන්ති ගාස්තු ඉහළ යැම හේතුවෙන් වසරේ වැඩි කාලයක් තුළ ස්ථාවර මට්ටම්වල පැවති අධ්‍යාපන උප කාණ්ඩයට අයත් අයිතමවල මිල ගණන් 2021 සැප්තැම්බර් මාසයේ සිට ඉහළ ගියේය. පුද්ගලික වෛද්‍ය සේවා ගාස්තු, පුද්ගලික රෝහල්/වෛද්‍ය රසායනාගාර සඳහා ගෙවීම් සහ වෛද්‍ය/ඖෂධ නිෂ්පාදනවල ගාස්තු මිල ගණන් වරින්වර සංශෝධනය වූ අතර, එහි ප්‍රතිඵලයක් ලෙස 2021 අප්‍රේල් මාසයේ සිට සෞඛ්‍ය උප කාණ්ඩයේ අයිතමවල මිල ගණන් අඛණ්ඩව වැඩි විය. මේ අතර, නිවාස කුලී 2021 ඔක්තෝබර් මාසයේ වැඩි වූ නමුත් එම වැඩිවීම කොවිඩ්-19 වසංගත තත්ත්වයට පෙර සිදු වූ නිවාස කුලී වැඩිවීමට සාපේක්ෂව අඩු මට්ටමක පැවති අතර, 2021 සැප්තැම්බර් මාසයේ සිට ගෘහ නඩත්තු සහ උපකරණවල පිරිවැයෙහි කැපී පෙනෙන ඉහළ යැමක් දක්නට ලැබුණි. මේ අතර, 2020 වසර තුළ බොහෝ දුරට ස්ථාවර මට්ටම්වල පැවති ඇඳුම් සහ පාවහන් මිල ගණන් 2021 ඔක්තෝබර් මාසයේ සිට අඛණ්ඩව ඉහළ වැඩිවීමක් පෙන්නුම් කළේය.


## පාරිභෝගික මිල දර්ශක

### කොළඹ පාරිභෝගික මිල දර්ශකය

**කො.පා.මි.ද. 2021 ජනවාරි මාසයේ පැවති දර්ශකාංක 138.7හි සිට 2021 දෙසැම්බර් මාසයේ දී දර්ශකාංක 154.7 දක්වා වේගයෙන් ඉහළ ගියේය.** 2021 ජනවාරි සහ පෙබරවාරි මාසවල දී දක්නට ලැබුණු මාසික ඉහළ යැම් සඳහා ආහාර සහ ආහාර නොවන කාණ්ඩ දෙකෙහිම මිල ගණන්හි සිදු වූ විචලන හේතු විය. එසේ වුවද, 2021 මාර්තු සහ අප්‍රේල් මාස දෙක තුළ දී

4 සෞදි ඇරැම්කෝ (Saudi Aramco) එල්.පී. ගෑස් මිල

**4.14 රූප සටහන**
**කො.පා.මි. දර්ශකයෙහි මාසික ප්‍රතිශත වෙනස සඳහා දායකත්වය - 2021**




(අ) ආහාර නොවන කාණ්ඩයේ පරිපාලිත අයිතම ලෙස විදුලිය, එල්.පී. ගෑස්, ඉන්ධන, බස් ගාස්තු සහ දුම්රිය ගාස්තු සැලකේ.
(ආ) ආහාර නොවන කාණ්ඩයේ පරිපාලිත අයිතම හැර ඉතිරි අයිතම


මූලයන්: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

කො.පා.මි.ද. පහළ ගිය අතර, එයට මුළුමනින්ම දායක වූයේ ආහාර කාණ්ඩයේ අයිතමවල මිල ගණන්හි සිදු වූ විචලනයන්ය. ඉන් පසුව, 2021 මැයි සහ ජූනි මාසවල දී කො.පා.මි.ද. ඉහළ යැම සඳහා ආහාර සහ ආහාර නොවන කාණ්ඩ දෙකෙහිම අයිතමවල මිල ගණන් ඉහළ යැම දායක වූ අතර, ආහාර කාණ්ඩය සාපේක්ෂ වශයෙන් වැඩි දායකත්වයක් දක්වන ලදී. 2021 ජූලි මාසයේ දී කො.පා.මි.ද. ඉහළ යැමට මුළුමනින්ම දායක වූයේ ආහාර නොවන කාණ්ඩයේ අයිතමවල මිල ගණන්හි සිදු වූ විචලන වුවද, 2021 අගෝස්තු සහ සැප්තැම්බර් මාසවල දී කො.පා.මි.ද. ඉහළ යැම සඳහා ආහාර සහ ආහාර නොවන කාණ්ඩ දෙකෙහිම අයිතමවල මිල ඉහළ යැම් දායක විය. එමෙන්ම, 2021 ඔක්තෝබර් සිට දෙසැම්බර් දක්වා කාලය තුළ නිරීක්ෂණය කළ කැපී පෙනෙන මාසික වැඩිවීම් සඳහා ආහාර සහ ආහාර නොවන කාණ්ඩ දෙකෙහිම අයිතමවල මිල ගණන් දායක වූ අතර, වැඩි දායකත්වය දැක්වූයේ ආහාර කාණ්ඩයයි.

### ජාතික පාරිභෝගික මිල දර්ශකය

**2021 මාර්තු මාසයේ වාර්තා වූ මාසික පහළ යැම හැරුණු විට, ජා.පා.මි.ද. 2021 ජනවාරි මාසයේ දී දර්ශකාංක 142.1හි සිට 2021 දෙසැම්බර් මාසයේ දී දර්ශකාංක 161.0 දක්වා අඛණ්ඩව ඉහළ ගියේය.** 2021 ජනවාරි සහ පෙබරවාරි මාසවල ජා.පා.මි. දර්ශකයෙහි දක්නට ලැබුණු මාසික ඉහළ යැම් සඳහා ආහාර කාණ්ඩයේ අයිතමවල මිල ගණන්හි ඉහළ යැම් ප්‍රධාන

**4.15 රූප සටහන**
**ජා.පා.මි. දර්ශකයෙහි මාසික ප්‍රතිශත වෙනස සඳහා දායකත්වය - 2021**




(අ) ආහාර නොවන කාණ්ඩයේ පරිපාලිත අයිතම ලෙස විදුලිය, එල්.පී. ගෑස් ඉන්ධන, බස් ගාස්තු සහ දුම්රිය ගාස්තු සැලකේ.
(ආ) ආහාර නොවන කාණ්ඩයේ පරිපාලිත අයිතම හැර ඉතිරි අයිතම

මූලයන්: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

වශයෙන් දායක විය. 2021 මාර්තු මාසයේ දී වාර්තා වූ මාසික පහළ යෑමට මුළුමනින්ම හේතු වූයේ ආහාර කාණ්ඩයේ අයිතමවල මිල ගණන් පහළ යෑමයි. කෙසේ වුවද, ඉන් අනතුරුව 2021 අප්‍රේල් මාසයේ දී කොවිඩ්-19 වසංගතයේ තුන්වන රැල්ල ආරම්භ වීමත් සමඟ ආහාර සහ ආහාර නොවන කාණ්ඩ දෙකෙහිම අයිතමවල මිල ගණන් ඉහළ යෑම හේතුවෙන්, 2021 දෙසැම්බර් මාසය දක්වා ජා.පා.මි.ද. ඉහළ ගියේය. මෙම කාලපරිච්ඡේදය තුළ 2021 සැප්තැම්බර් සහ ඔක්තෝබර් මාසවල ජා.පා.මි.ද. ඉහළ යෑමට ප්‍රධාන වශයෙන් ආහාර නොවන කාණ්ඩය දායක වූ අතර ඉතිරි මාස සඳහා ආහාර කාණ්ඩය විසින් සැලකිය යුතු දායකත්වයක් සපයන ලදී. ආහාර අයිතමවල සැපයුමෙහි ඇති වූ හිඟය හේතුවෙන් එම අයිතමවල මිල ඉහළ ගිය අතර, ජනගහනයේ ඇතැම් කොටස්වල මුදල් ආදායම් තත්ත්වය ඉහළ යෑමද ආහාර අයිතමවල මිල තවදුරටත් ඉහළ යෑමට බලපෑමක් ඇති කළේය.

### නිෂ්පාදකයාගේ මිල දර්ශකය (නි.මි.ද.)

**ජනලේඛන සහ සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් කෘෂිකර්මාන්ත, නිෂ්පාදන සහ උපයෝගිතා අංශවල දේශීය භාණ්ඩ සහ සේවා නිෂ්පාදකයන්ට ලැබෙන සාමාන්‍ය මිල ගණන් මත පදනම්ව සම්පාදනය කරනු ලබන නි.මි. දර්ශකයෙහි පදනම් කාලපරිච්ඡේදය වූ 2013 සිව්වන කාර්තුව, 2018 සිව්වන කාර්තුව වශයෙන් 2021 නොවැම්බර් මාසයේ දී යාවත්කාලීන කරන ලදී.** ඒ අනුව, වත්මන් ආර්ථික ප්‍රවණතා පිළිබිඹු වන අයුරින් නි.මි. දර්ශකයෙහි බර තැබීම් සහ මිල ගණන් යාවත්කාලීන කරන ලදී. තවද, නි.මි. දර්ශකය සඳහා නව අයිතම කිහිපයක් එකතු කිරීමත්, නිෂ්පාදන උප අංශයේ භූගෝලීය ආවරණය පුළුල් කිරීමට අමතරව, කෘෂිකර්ම සහ නිෂ්පාදන උප අංශ දෙකෙහි පැවති අයිතම කිහිපයක් ඉවත් කිරීමත් සිදු කරන ලදී. නි.මි.ද. (2018 සිව්වන කාර්තුව=100) 2021 ජනවාරි මාසයේ දී දර්ශකාංක 116.0ක් වාර්තා කළ අතර එතැන් සිට 2021 දෙසැම්බර් මාසයේ දී දර්ශකාංක 133.7 දක්වා සමස්තයක් ලෙස ඉහළ යන ප්‍රවණතාවක් පෙන්නුම් කළේය. කෘෂිකාර්මික උප අංශයේ නි.මි.ද. 2021 ජනවාරි මාසයේ දර්ශකාංක 134.0ක් වාර්තා කළ අතර, ඉන් අනතුරුව එය සාපේක්ෂව ස්ථාවර මට්ටමක පැවතෙමින් වසරේ අවසන් මාස පහ තුළ අඛණ්ඩව ඉහළ ගොස් දෙසැම්බර් මාසයේ දී දර්ශකාංක 161.7 දක්වා ළඟා විය. මේ අතර, නිෂ්පාදන උප අංශයේ නි.මි.ද. 2021 ජනවාරි සහ දෙසැම්බර් මාසවල දී පිළිවෙළින් දර්ශකාංක 113.9ක් සහ දර්ශකාංක 131.4ක් වාර්තා කළ අතර මෙම වසර තුළ වැඩි වශයෙන් මාසික ඉහළ යෑම් මෙම උප අංශයෙන් වාර්තා විය. 2021 ජනවාරි මාසයේ දී දර්ශකාංක 100.1ක් වාර්තා කළ උපයෝගිතා (විදුලිය, ගෑස්, වාෂ්ප සහ වායු සැකසුම් සැපයුම සහ ජලය එක්රැස් කිරීම, ප්‍රතිකාරක යෙදීම හා සැපයීම) උප අංශයේ නි.මි.ද. පළමු මාස හතර තුළ කැපී පෙනෙන උච්චාවචනයන් පෙන්නුම් කළ අතර පසුව වසර පුරා ස්ථාවර වෙමින් 2021 දෙසැම්බර් මාසයේ දී දර්ශකාංක 102.5ක් වාර්තා කළේය.

4

## 4.3 වැටුප්

**2020 වසරට සාපේක්ෂව 2021 වසරේ දී විධිමත් හා අවිධිමත් පෞද්ගලික අංශයේ සේවකයන්ගේ මූර්ත වැටුප් ඉහළ යෑමක් පෙන්නුම් කළ අතර, රාජ්‍ය අංශයේ සේවකයන්ගේ මූර්ත වැටුප් පහළ යෑමක් පෙන්නුම් කරන ලදී.** 2020 වසරට සාපේක්ෂව 2021 වසරේ දී පෞද්ගලික අංශයේ සේවකයන්ගේ නාමික වැටුප් ද ඉහළ යෑමක් පෙන්නුම් කළ අතර, රාජ්‍ය අංශයේ සේවකයන්ගේ නාමික වැටුප් නොවෙනස්ව පැවතිණි. සංචරණ සීමා සහ ආර්ථික ක්‍රියාකාරකම්වල පසුබෑම වැනි කොවිඩ්-19 වසංගතය නිසා ඇති වූ අහිතකර බලපෑම්, 2021 වසරේ වැටුප් වර්ධනයන් කෙරෙහි සෘණාත්මක බලපෑම් ඇති කළේය. ඒ අතර, කොවිඩ්-19 එන්නත්කරණ වැඩසටහන සාර්ථකව ක්‍රියාත්මක වීමත් සමඟ ආර්ථික ක්‍රියාකාරකම් සාමාන්‍යකරණය වීම සහ විධිමත් පෞද්ගලික අංශයේ සේවකයන්ගේ අවම වැටුප් වැඩි කිරීමට ගත් තීරණය, විශේෂයෙන්ම විධිමත් හා අවිධිමත් පෞද්ගලික අංශයේ වැටුප් කෙරෙහි ධනාත්මක බලපෑමක් ඇති කළේය.


### පෞද්ගලික අංශයේ වැටුප්

**අවිධිමත් පෞද්ගලික අංශයේ වැටුප් ප්‍රමාණ දර්ශකය (2012=100) මගින් මනිනු ලබන අවිධිමත් පෞද්ගලික අංශයේ සේවකයන්ගේ නාමික වැටුප් 2021 වසර තුළ සමස්තයක් ලෙස ඉහළ යෑමේ ප්‍රවණතාවක් පෙන්නුම් කළේය.** 2021 අප්‍රේල් මාසයේ වාර්තා වූ සුළු පහළ යෑම සහ 2021 සැප්තැම්බර් සහ ඔක්තෝබර් මාස දෙකෙහි වාර්තා වූ තියුණු ඉහළ යෑම් හැර වසරේ ඉතිරි මාසවල දී නාමික වැටුප් ප්‍රමාණ දර්ශකය සාමාන්‍ය වැඩිවීම් වාර්තා කළේය. 2021 අප්‍රේල් මාසයේ නිරීක්ෂණය වූ පහළ යෑමට කුඩා කර්මාන්ත ක්‍රියාකාරකම්වල වැටුප් පහත වැටීම හේතු වූ අතර, 2021 සැප්තැම්බර් සහ ඔක්තෝබර් මාසවල නිරීක්ෂණය වූ තියුණු වැටුප් ඉහළ යෑම සඳහා කෘෂිකර්ම, කර්මාන්ත සහ සේවා යන සියලුම උප ක්‍රියාකාරකම් හේතු විය. මෙම වර්ධනයන් සමඟ, අවිධිමත් පෞද්ගලික අංශයේ නාමික වැටුප් ප්‍රමාණ දර්ශකය 2020 වසරට සාපේක්ෂව 2021 වසරේ දී සියයට 9.2කින් ඉහළ ගියේය. මේ අතර, කෘෂිකර්ම අංශයේ නාමික වැටුප් සියයට 6.4කින් ද, කර්මාන්ත අංශයේ නාමික වැටුප් සියයට 9.7කින් ද, සේවා අංශයේ නාමික වැටුප් සියයට 10.0කින් ද 2020 වසරට සාපේක්ෂව 2021 වසරේ දී ඉහළ ගියේය. කොවිඩ්-19 ආශ්‍රිත සංචරණ සීමා ලිහිල් කිරීම සහ රට පුරා එන්නත්කරණ වැඩසටහන ක්‍රියාත්මක වීම සමඟ ආර්ථික ක්‍රියාකාරකම් සාමාන්‍යකරණය වීම, අවිධිමත් අංශයේ වැටුප් ඉහළ යෑමට මූලික විය. තවද, සේවා නියුක්ත ජනගහනයෙන් පිළිබිඹු වන පරිදි කර්මාන්ත අතර සිදුව ඇති ශ්‍රම විතැන් වීම් හේතුවෙන් ඇති වූ ශ්‍රම ඉල්ලුම වැඩිවීම ද අදාළ වැටුප්වල ඉහළ යෑම්වලට හේතු විය. තවද, විශේෂයෙන්ම 2021 වසරේ අවසාන භාගයේ දී අවිධිමත් අංශයේ වැටුප් වැඩිවීමට ජීවන වියදම ඉහළ යෑම ද දායක විය. මේ අතර, අවිධිමත් පෞද්ගලික අංශයේ මූර්ත වැටුප් ප්‍රමාණ දර්ශකය 2020 වසරට සාපේක්ෂව 2021 වසරේ දී සියයට 2.0කින් ඉහළ ගියේය.

**පඩි පාලක සභා මගින් පාලනය වන සේවකයන්ගේ අවම වැටුප් ප්‍රමාණ දර්ශකය (1978 දෙසැම්බර්=100) මගින් මනිනු ලබන විධිමත් පෞද්ගලික අංශයේ[5] සේවකයන්ගේ නාමික වැටුප් 2020 වසරට සාපේක්ෂව 2021 වසරේ දී සියයට 74.4කින් සැලකිය යුතු ලෙස ඉහළ ගියේය.** මෙම ඉහළ යෑමට, 2021 මාර්තු 05 වන දින සිට බලපැවැත්වෙන පරිදි තේ සහ රබර් වගා කිරීමේ සහ නිෂ්පාදනය කිරීමේ ක්ෂේත්‍රයට අදාළ පඩි පාලක සභාව මගින් තේ සහ රබර් වතු කම්කරුවන්ගේ දෛනික වැටුප රුපියල් 1,000 දක්වා වැඩි කිරීම හේතු විය. තවද, 2016 අංක 03 දරන ජාතික අවම සේවක වැටුප් පනතට ගෙන එන ලද සංශෝධනය අනුව 2021 අගෝස්තු 16 දින සිට පෞද්ගලික අංශයේ අවම මාසික වැටුප රුපියල් 10,000 සිට රුපියල් 12,500ක් දක්වා සහ අවම දෛනික වැටුප රුපියල් 400 සිට රුපියල් 500ක් දක්වා වැඩි කිරීම ද මෙම නාමික වැටුප් වැඩිවීමට දායක විය. ඒ අනුව, විධිමත් පෞද්ගලික අංශයේ මූර්ත වැටුප් ප්‍රමාණ දර්ශකය ද පසුගිය වසරට සාපේක්ෂව 2021 වසරේ දී සියයට 64.3කින් සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. මේ අතර, කොවිඩ්-19 වසංගතය හේතුවෙන් නිවසේ රැඳී සිටීමට සිදු වූ සේවකයන්ට අවසන්වරට ගෙවන ලද මූලික වැටුපෙන් සියයට 50ක් හෝ මසකට රුපියල් 14,500ක් යන විකල්ප අතරින් සේවකයාට වඩාත් වාසිදායක වන පරිදි වැටුප් ගෙවීමේ එකඟතාවක් සහිත වූ ත්‍රෛපාර්ශ්වීය ගිවිසුම, සංචාරක අංශ සඳහා 2021 දෙසැම්බර් දක්වා දීර්ඝ කරන ලදී.

5 පඩිපාලක සභා මගින් වැටුප් පාලනය වන විධිමත් පෞද්ගලික අංශයේ සේවකයන්ගේ නාමික වැටුප්, කම්කරු දෙපාර්තමේන්තුව විසින් සම්පාදනය කරන අවම වැටුප් ප්‍රමාණ දර්ශකය (1978 දෙසැම්බර්=100) මගින් ගණනය කරනු ලබයි.

**4.16 රූප සටහන**
**2021 වසරේ අවිධිමත් පෞද්ගලික අංශයේ නාමික වැටුප් ප්‍රමාණ දර්ශකයේ විචලනය**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

### රාජ්‍ය අංශයේ වැටුප්

**රාජ්‍ය අංශයේ වැටුප් ප්‍රමාණ දර්ශකය (2016=100) මගින් මනිනු ලබන රාජ්‍ය අංශයේ සේවකයන්ගේ නාමික වැටුප්, පසුගිය වසරට සාපේක්ෂව 2021 වසරේ දී නොවෙනස්ව පැවතුණි.** කෙසේ වෙතත්, 2020 වසරට සාපේක්ෂව 2021 වසරේ දී රාජ්‍ය අංශයේ සේවකයන්ගේ මූර්ත වැටුප් සියයට 6.4කින් පහළ ගියේය. 2022 ජනවාරි මස සිට බලපැවැත්වෙන පරිදි මුදල් අමාත්‍යාංශය විසින් ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ, ශ්‍රී ලංකා ගුරු උපදේශක සේවයේ සහ ශ්‍රී ලංකා ගුරු සේවයේ පැවති වැටුප් විෂමතා ඉවත් කිරීම සඳහා සිදු කළ වැටුප් වැඩිවීම් සහ රාජ්‍ය අංශයේ සේවකයන් සඳහා ලබා දුන් රුපියල් 5,000ක විශේෂ දීමනාව, රාජ්‍ය අංශයේ වැටුප් කෙරෙහි 2022 වසරේ දී ධනාත්මක බලපෑමක් ඇති කරනු ඇත.